**2025-02-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. රජයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය - 2024 හතරවන කාර්තුව**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 53(1) වගන්තිය අනුව, අවම වශයෙන් කාර්තුමය පදනමක් මත මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් රජයේ ආදායම් සහ වියදම් ඇතුළු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයක් කාර්තුව අවසන් වී දින 45කට නොඅඩු කාලයක් තුළදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එම විධිවිධාන පරිදි 2024-12-31 දිනෙන් අවසන් වන 2024 හතරවන කාර්තුව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 2025-02-14 දින හෝ ඊට පෙර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇති වර්ගීකරණයන් මත පදනම්ව 2024-12-31 දිනෙන් අවසන් වන හතරවන කාර්තුව දක්වා සියලුම විශේෂ වියදම් ඒකක, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වාර්තා කරන ලද සමුච්චිත ආදායම් සහ වියදම් ඇතුළත්ව සකස් කරනු ලැබ ඇති මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

**02. ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර අන්‍යෝන්‍ය ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ යෝජිත ගිවිසුම**

ආයෝජකයින් සහ ඔවුන්ගේ ආයෝජන සඳහා හිතකර ආයතනික පරිසරයක් සහතික කිරීම මඟින් සෘජු විදේශ ආයෝජන නියාමනය සඳහා නීතිමය යාන්ත්‍රණයක් සම්පාදනය කිරීම පිණිස ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර අන්‍යෝන්‍ය ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබීමට දෙපාර්ශ්වය විසින් එකඟතාවකට පැමිණ තිබේ. යෝජිත ගිවිසුමට අත්සන් තැබීම මඟින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමට මෙන්ම, ආයෝජන සහ වෙළෙඳාම ආශ්‍රිත ක්ෂේත්‍රවල දෙරට අතර පවතින ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට හැකියාව ලැබෙනු ඇත. දෙපාර්ශ්වය අතර අත්සන් තැබීමට යෝජිත ගිවිසුමට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, 2025 ලෝක රාජ්‍ය සමුළුවට සහභාගි වීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිදු කිරීමට නියමිත රාජ්‍ය සංචාරය අතරතුරදී එකී ගිවිසුමට අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ලේඛන ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යක්ෂමතාව, නිරවද්‍යතාව සහ ප්‍රවේශතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් එහි ලේඛන ඩිජිටල්කරණය කිරීම රටේ බුද්ධිමය දේපළ පරිපාලනය සහ බලාත්මක කිරීම උදෙසා අත්‍යවශ්‍ය පියවරක් බවට හඳුනාගනු ලැබ ඇත. මාර්ගගත ලියාපදිංචි කිරීමේ පහසුකම්, ඉලෙක්ට්‍රොනික ගොනු කිරීමේ හා වාර්තා තබා ගැනීමේ පද්ධතීන්, අධිලේඛනගත වාර්තා ඩිජිටල්කරණය සහ එබඳු ඩිජිටල්කරණ වැඩසටහන් යටතේ මාර්ගගත සන්නිවේදන වේදිකා හඳුන්වා දීම මඟින් වඩා විශ්වසනීය, වඩා වේගවත් සහ පරිශීලක හිතකාමී බුද්ධිමය දේපළ සේවා සැලසීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මෙහෙයුම් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට පහසු වනු ඇත. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 70.2ක් වටිනා තාක්ෂණික සහ සේවා ප්‍රදානයක් ලබා දීමට ලෝක බුද්ධිමය දේපළ සංවිධානය එකඟ වී තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ලේඛන ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත්, යෝජිත ප්‍රදානය ලබා ගැනීම පිණිස ලෝක බුද්ධිමය දේපළ සංවිධානය සමඟ සහයෝගිතා ගිවිසුමකට අත්සන් තැබීමටත් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. සපුගස්කන්ද තෙල් පිරිපහදු සංකීර්ණය සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම

වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය යන දෙඅංශයෙන්ම යුතුව සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීමට සහ වැඩිදියුණු කිරීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විවිධ ප්‍රයත්නයන් දරා ඇති නමුත්, ඒවා සාර්ථක වී නොමැත. එම කාර්යය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් වෙන්ව වෙනම රාජ්‍ය ව්‍යවසායක් ලෙස සපුගස්කන්ද තෙල් පිරිපහදුව ස්ථාපිත කර සුදුසු උපායමාර්ගික ආයෝජන හවුල්කරුවෙකු හඳුනා ගැනීම සඳහාත් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීමේ හැකියාව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහාත් මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැත. වත්මන් රජයේ බලශක්ති ප්‍රතිපත්ති රාමුව යටතේ දැනට පවත්නා පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් ඉදිකිරීම ප්‍රමුඛ කාර්යයක් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව, 2022 වර්ෂයේදී සිදු කරන ලදශක්‍යතා අධ්‍යයනය මත පදනම්ව සුදුසු ආයෝජන හවුල්කරුවෙකු හඳුනා ගැනීම පිණිස අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය

ලබා දී තිබේ. ඒ අනුව, සපුගස්කන්ද තෙල් පිරිපහදුව සංවර්ධනය කිරීම සහ එම පරිශ්‍රය තුළම ඉදිකිරීම, මෙහෙයුම් හා පැවරීම (BOT) පදනම මත දිනකට බැරල් 100,000ක ධාරිතාවකින් යුත් නව පිරිපහදුවක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු මූලා සම්පාදක/ආයෝජකයින් හඳුනාගැනීම සහ තෝරා ගැනීම සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීමටත්, සුදුසුකම් සපුරන ආයතන වෙතින් යෝජනා කැඳවීමටත් බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **නව සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම - ශ්‍රී ලංකා මහ බැංකුව**

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලේ මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මේ වන විට මිලියන 21.5ක් පමණ වන අතර, දායක මුදල් ප්‍රේෂණය කරනු ලබන ක්‍රියාකාරී සේවා යෝජකයින් සංඛ්‍යාව 77,000ක් පමණ වේ. 2024 ඔක්තෝබර් මාසය අවසන් වන විට අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 4.2ක් වන අතර, පසුගිය වසර කිහිපය තුළ එහි වත්කම්වල වාර්ෂික වර්ධනය 9%ට වඩා ඉහළ අගයක් වාර්තා කරමින් අඛණ්ඩ වර්ධනයක් ළඟා කර ගෙන ඇත. සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහා විශාල ගනුදෙනු ප්‍රමාණයක් සැකසිය හැකි පරිශීලක ගිණුම් සහ දත්ත විශාල ප්‍රමාණයක් උපරිම කාර්යක්ෂමතාවකින් පවත්වාගෙන යාමට තරම් ශක්‍යතාවයකින් යුතු තොරතුරු තාක්ෂණ පද්ධතියක අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, නව සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ලෝක බැංකු සමූහයේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේදී ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, ඉන්දියාවේ PricewaterhouseCoopers Private Limitedහි උපදේශකත්වය යටතේ නව කළමනාකරණ පද්ධතියේ සැලසුම් සහ අවශ්‍ය පිරිවිතර සකස් කිරීම අවසන් කර ඇත. එම කරුණු සැලකිල්ලට ගනිමින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධති සම්බන්ධකයෙක් (System Integrator) තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත්වීමේ/සංක්‍රමණ ප්‍රදේශය තුළ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක ආහාරපාන ජාලවල අලෙවිසැල් ක්‍රියාත්මක කිරීම

කටුනායක, බණ්ඩාරනායක ගුවන්තොටුපොළෙහි පිටත්වීමේ/සංක්‍රමණ ප්‍රදේශයේ 20-D, 29-D, 39-D සහ 42-D යන අවකාශ 4හි ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක ආහාරපාන ජාලාවල අලෙවිසැල් වසර 03ක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය මෙහෙයුම්කරුවන් තෝරා ගැනීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසුකරුවන් 06 දෙනෙක් ඉදිරිපත්ව තිබේ. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද පහත සඳහන් ආයතන සමඟ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම පිණිස ගිවිසුම්ගත වීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

| අවකාශ අංකය | ආයතනය | සමස්ත කොන්ත්‍රාත් වටිනාකම (ඇ.ඩො.මිලියන) |
|---|---|---|
| 20-D | HMS Host Services India (Pvt) Ltd | 1.57 + අදාළ බදු |
| 29-D | Barista Coffee Lanka (Pvt) Ltd | 0.60 + අදාළ බදු |
| 39-D | Jubilant Food Works Lanka (Pvt) Ltd | 1.99 + අදාළ බදු |
| 42-D | Gamma Pizzakraft Lanka (Pvt) Ltd. | 3.06 + අදාළ බදු |

## 07. උතුරු සහ නැගෙනහිර පළාත්වල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම

වර්තමාන රජය විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගනු ලැබ ඇති අතර, මාර්ග අලුත්වැඩියා කිරීම, ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා පුළුල් ප්‍රවේශයක් හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, උතුරු සහ නැගෙනහිර පළාත්වල බොහෝ මාර්ග අබලන් තත්ත්වයේ පවතින බැවින්, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන

පරිදි උතුරු පළාත තුළ මාර්ග කිලෝමීටර 1,500ක් සහ නැගෙනහිර පළාත තුළ මාර්ග කිලෝමීටර 500ක් සංවර්ධනය කිරීම පිණිස ප්‍රමුඛතාව ලබා දීමට තීරණය කර ඇත. පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා මාර්ග තෝරා ගැනීම පිණිස මහජනතාව, ප්‍රජාපාදක සංවිධාන සහ පළාත් පාලන ආයතනවල සහභාගිත්වය ලබා ගනු ලබන අතර, නිර්දේශිත මාර්ග ලැයිස්තුව සඳහා අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වේ. ඒ අනුව, උතුරු හා නැගෙනහිර පළාත්වල යෝජිත ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන පරිදි නිකුත් කරන ලද නියමය සහ සුරාබදු ආඥාපනතේ විධිවිධාන පරිදි නිකුත් කරන ලද නිවේදනය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

මෝටර් රථ, දුම්වැටි, පැණිබීම සහ දුම්කොළ ඇතුළු රුපියල් වටිනාකමින් නිශ්චිතව දක්වා ඇති නිෂ්පාදන බද්දට යටත් සියලුම අයිතම සඳහා වන නිෂ්පාදන බද්ද 2025-01-11 දින සිට ක්‍රියාත්මක වන පරිදි 5.9%කින් වැඩි කරනු ලැබ ඇත. එම තීරණය බලාත්මක කරමින් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය 2025-01-10 දිනැති අංක 2418/43 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබේ.

එසේම, 2025-01-11 දින සිට බලපැවැත්වෙන පරිදි මත්පැන් සඳහා වන සුරාබද්ද 5.9%කින් වැඩි කර ඇති අතර, ඒ සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වන වගන්තිය යටතේ අංක 01/2025 දරන සුරාබදු නිවේදනය 2025-01-10 දිනැති අංක 2418/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

ඒ අනුව, ඉහත සඳහන් නියමය සහ සුරාබදු නිවේදනය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීම**

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත මඟින් වී සහ සහල් මිල දී ගැනීම, අලෙවි කිරීම, සැපයීම, කෙටීම, පැහීම සහ සකස් කිරීම ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා මණ්ඩලයක් පිහිටුවීමට අවශ්‍ය විධිවිධාන සහ ඊට අදාළ සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වන ආනුෂාංගික කරුණු සඳහා නෛතික විධිවිධාන සලස්වා ඇත. එම පනත පැනවූ 1971 සිට මේ දක්වා වසර 54ක් ගතවී ඇති නමුත් ඒ සඳහා කිසිදු සංශෝධනයක් සිදු කර නොමැති යාවත්කාලීන නොවූ පනතක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. එම පනතේ සඳහන් විධිවිධාන වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත වන බැවින් දැනට ගැටලුවක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති අවිධිමත් ලෙස වී සහ සහල් තොග රැස්කිරීම හා ගබඩා කිරීම නියාමනය කිරීම පිණිස බලපත්‍ර ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා පනතේ අදාළ විධිවිධාන කඩිනමින් සංශෝධනය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කරමින් අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාලරාමු හඳුනාගෙන ඒ ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු බඳවාගැනීම් ප්‍රමාණයන් හඳුනාගෙන ඒ අනුව, අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගෙන් ප්‍රධානත්වයෙන් නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස 2024-12-30 දින පැවති රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම කමිටුව වෙත ඒ ඒ අමාත්‍යාංශ විසින් එම අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවල පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් බඳවාගැනීම් සිදු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත අනුමැතිය ලබා දීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

| අනු අංකය | අමාත්‍යාංශ/පළාත් සභා/කොමිෂන් සභා | බඳවාගැනීම සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලද තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 3,000 |
| 2. | ආරක්ෂක අමාත්‍යාංශය | 09 |
| 3. | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 179 |
| 4. | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 132 |
| 5. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 400 |
| 6. | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 161 |
| 7. | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 3,519 |
| 8. | බස්නාහිර පළාත් සභාව | 34 |
| 9. | නැගෙනහිර පළාත් සභාව | 05 |
| 10. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 17 |
| | මුළු සංඛ්‍යාව | 7,456 |

**************